# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත

## பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்

## CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My Ref. | CSS/7/1/3 | ඔබේ අංකය<br>உனது இல<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2019.08. 02 |

**ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) – 06-2019**

සියළුම පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්,
දකුණු පළාත් සභාවේ සියළුම රාජ්‍ය සංස්ථා,ව්‍යවස්ථාපිත මණ්ඩල සහ
සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සභාපතිවරුන් වෙත,

**<u>රාජ්‍ය සංස්ථා,ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් සඳහා වෘත්තීය දීමනාවක් ලබා දීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කර ඇති 2017.10.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ 05/2017, අංක දරණ චක්‍රලේඛය හා බැඳේ.(එම චක්‍රලේඛයේ පිටපතක් මේ සමඟ අමුණා ඇත.)

02. මෙම චක්‍රලේඛයේ සඳහන් කොන්දේසි වලට යටත්ව ,පහත පරිදි දකුණු පළාත් සභාවට අයත් රාජ්‍ය සංස්ථා,ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් සඳහා වෘත්තීය දීමනාවක් ලබා දීමට 2019.07.23 වන දින දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දී ඇත.

**ගෙවිය යුතු මාසික වෘත්තීය දීමනාව**

| කාණ්ඩය | මාසික දීමනාව |
|---|---|
| වසර 06 කට අඩු සක්‍රීය සේවා කාලයක් සහිත නිලධරයන් | රු.3,000/- |
| වසර 06 ක් හෝ එයට වැඩි සහ වසර 11 ට අඩු සක්‍රීය සේවා කාලයක් සහිත නිලධරයන් | රු.5,000/- |
| වසර 11 ක් හෝ එයට වැඩි සහ වසර 19 ට අඩු සක්‍රීය සේවා කාලයක් සහිත නිලධරයන් | රු.10,000/- |
| වසර 19 ක් හෝ එයට වැඩි සක්‍රීය සේවා කාලයක් සහිත නිලධරයන් | රු.15,000/- |

**03.**ඒ අනුව ඉහත පරිදි දීමනා ගෙවීමේ දී 2017.10.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ 05/2017 හි සඳහන් කොන්දේසි වලට යටත්ව,සියළු ගෙවීම් සිදු කරන ලෙස ද වැඩිදුරටත් කාරුණිකව දැනුම් දෙමි.

**ආර්.සී.ද සොයිසා,**
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත්:- 1. සහකාර විගණකාධිපති- දකුණු පළාත - දැ:ගැ:ස

2.දකුණු පළාත් අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ - දැ:ගැ:ස


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 2232343
කාර්යාලය / காரியாலயம் / Office 091 2234052 091 2226118
ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299
විද්‍යුත් තැපැල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

# මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
# நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு
# MINISTRY OF FINANCE AND MASS MEDIA

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය - මුදල් / அலுவலகம் - நிதி / Office - Finance: (+94)-11-2484500, (+94)-11-2484600, (+94)-11-2484700
ෆැක්ස් - මුදල් / பெக்ஸ் - நிதி / Fax - Finance: (+94)-11-2449823
කාර්යාලය - ජනමාධ්‍ය / அலுவலகம் - வெகுசன ஊடக / Office - Mass Media: (+94)-11-2513459, (+94)-11-2513498, (+94)-11-2512324
ෆැක්ස් - ජනමාධ්‍ය / பெக்ஸ் - வெகுசன ஊடக / Fax - Mass Media: (+94)-11-2513458
වෙබ් අඩවි / வெப் சைட்கள் / Websites: www.treasury.gov.lk, www.media.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: එම්.එස්.ඩී./චක්‍රලේඛ / 2017
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2017.10. 25

කළමනාකරණ සේවා චක්‍රලේඛ : 05/2017

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ
සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සභාපතිවරුන් වෙත,

**රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් සඳහා වෘත්තීය දීමනාවක් ලබා දීම**

රාජ්‍ය සංස්ථා. ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් සඳහා 2017.08.15 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී, පහත සඳහන් (02) ඡේදයේ කොන්දේසිවලට යටත්ව වෘත්තීය දීමනාවක් 2017.10.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ගෙවීමට තීරණය කර ඇත.

01. ගෙවිය යුතු මාසික වෘත්තීය දීමනාව

| කාණ්ඩය | මාසික දීමනාව (රු.) |
|---|---|
| වසර 06 කට අඩු සක්‍රිය සේවා කාලයක් සහිත නිලධරයන් | රු. 3000/- |
| වසර 06 ක් හෝ එයට වැඩි සහ වසර 11 ට අඩු සක්‍රිය සේවා කාලයක් සහිත නිලධරයන් | රු. 5000/- |
| වසර 11 ක් හෝ එයට වැඩි සහ වසර 19 ට අඩු සක්‍රිය සේවා කාලයක් සහිත නිලධරයන් | රු. 10000/- |
| වසර 19 ක් හෝ එයට වැඩි සක්‍රිය සේවා කාලයක් සහිත නිලධරයන් | රු. 15000/- |

02. ඉහත දීමනාව ගෙවීමට අදාළ කොන්දේසි

I. මෙම දීමනාව කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 හි උපලේඛන III හි දැක්වෙන සේවක වර්ගීකරණයෙහි ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත්වන තනතුරු සඳහා පමණක් අදාළ කර ගත යුතුය.

II. මෙම දීමනාව ගෙවිය යුත්තේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 යටතේ වැටුප් ගෙවනු ලබන ආයතනවල අදාළ කාර්ය මණ්ඩල සඳහා පමණක් විය යුතුය.

III. මෙම දීමනාව සඳහා හිමිකම් ලබනුයේ, ඉහත චක්‍රලේඛයේ සඳහන් අයුරින්, දැනට ලබන වැටුපට අතිරේකව ගෙවනු ලබන ගැලපුම් දීමනාව සහ ජීවන වියදම් දීමනාවට අමතරව භාෂා ප්‍රවීණතා දීමනා, ප්‍රවාහන දීමනා, අවදානම් දීමනා සහ දුරකථන දීමනාව හැර, වෙනත් කිසිදු විශේෂ දීමනාවක් නොලබන නිලධරයන් පමණි.

IV. ජ්‍යෙෂ්ඨ මට්ටමේ සේවා කාලය ගණනය කිරීමේදී, නිලධරයෙකු එම ආයතනයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරක සේවය කළ සක්‍රීය සේවා කාලය පමණක් අදාළ කර ගත යුතුය.

ආර්. එච්. එස්. සමරතුංග
භාණ්ඩාගාරයේ ලේකම් සහ
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්

පිටපත් :-

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති
5. ලේකම්, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව

7/31

" විශිෂ්ටතම රාජ්‍ය සේවයක් උදෙසා "

# ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
# ஆளுநர் செயலகம்
# GOVERNOR'S SECRETARIAT

දකුණු පළාත, පහළ ඩික්සන් පාර, ගාල්ල
தென் மாகாணம், கீழ் டிக்சன் வீதி, காலி.
Southern Province, Lower Dickson Road, Galle.

මගේ අංකය / எனது இல / My No. } G/SP/1/2/1/1/19

ඔබේ අංකය / உமது இல / Your No: }

දිනය / திகதி / Date } 2019.07.25

31 JUL 2019

ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

**<u>රාජ්‍ය සංස්ථා,ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම් වල ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරින් සඳහා වෘත්තීය දීමනාවක් ලබා දීම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මා ඇමතූ ඔබගේ අංක CSS/7/6/3/2 හා 2019.07.02 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම් නිකුත් කර ඇති 2017.10.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 05/2017 දරණ චක්‍රලේඛය, එහි සඳහන් කොන්දේසි ප්‍රකාරව දකුණු පළාත් සභාවට අදාල කර ගැනීමට ගරු ආණ්ඩුකාරතුමා විසින් 2019.07.23 වන දින අනුමැතිය ලබා දුන් බව කාරුණිකව දන්වා සිටිමි.

ඒ.යු.වේලාරත්න
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත.

ඒ.යු. වේලාරත්න
ආණ්ඩුකාර ලේකම් - දකුණු පළාත
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
පහළ ඩික්සන් පාර,
ගාල්ල.

7/6

7/31


ආණ්ඩුකාර ලේකම්/ Governor's Secretary -Tp/Fax 091 2222498 විද්‍යුත් තැපෑල/ E-mail - governsecspc@sltnet.lk
සහකාර ලේකම්/ Assistant Secretary -Tp 091 2226990
නීති නිලධාරී/ Legal Officer -Tp 091 3097160 වෙබ් අඩවිය/ Web site - governer.sp.gov.lk
පරිපාලන නිලධාරී/Administrative Officer -Tp/Fax 091 2234480